# 11 ශුද්ධාත්ම ඵල

කිතුනු දිවිය අර්ථවත් කරනු ලබන ශුද්ධාත්ම ඵල හඳුනා ගෙන, අපගේ ජීවිත තුළ ඒවා වර්ධනය කර ගැනීමට යොමු වෙමු.



11.1 රූපය

කෑම කාමරයේ මේසය මත විවිධ පලතුරුවලින් යුත් කූඩයක් තබා ඇත. ඉන් විහිදෙන සුවඳින් මුළු නිවස ම පිරී ඉතිරී ගොසින් ය. විවිධ වර්ණවලින් යුත් එම පලතුරු සෝද, කපා ගත් විට ඒවායේ විවිධ රස බැලීමට අවස්ථාව උදා වනු ඇත. එම පලතුරුවලින්

- විවිධ රස
- විවිධ සුවඳ
- විවිධ පැහැය

ගෙන දෙන්නාක් මෙන් ආධ්‍යාත්මික වශයෙන් කිතුනු දිවිය රස ගන්වන ඵල 9ක් (රස 9ක්) පිළිබඳ ව ශු. පාවුලුතුමා කතා කරයි.

විමසුමට
ශු. බයිබලයෙන්
ගලාති 5:22-26



නොමිලේ බෙදාහැරීම සඳහා ය.

ශුද්ධාත්මයාණන් වහන්සේ කරණ කොට ගෙන අප ජීවිත තුළ වර්ධනය වන "ශුද්ධාත්ම ඵල"




අප තුළ වර්ධනය කර ගත යුතු ව ඇති මෙම ශුද්ධාත්ම ඵල එකිනෙක කෙටියෙන් විමසා බලමු.

**ප්‍රේමය** යනු කිසිදු ප්‍රතිඋපකාරයක් බලාපොරොත්තු නොවෙමින්, අන් අයගේ අවශ්‍යතාවයන් සැපිරීමට ඉදිරිපත් වීම වේ. මෙය අපගේ ජීවිත තුළ වර්ධනය කළ යුතු වැයවීමේ ප්‍රේමයකි.

**ප්‍රීතිය** යනු ලෞකික සතුට ඉක්මවා ගිය එනම්, දෙවියන් වහන්සේ තුළින් පමණක් ලද හැකි ප්‍රීතිය මෙයින් අදහස් වේ. මෙම ප්‍රීතිය නොනිවෙන පහනක් ලෙසින් නොනැසී නිරතුරුව ම අප හද අභ්‍යන්තරයේ දැල්විය යුතු වේ. එහි ඇරඹුම ශුද්ධාත්මයාණන් වහන්සේ ය.

**සාමය** යනු අප සාමාන්‍ය ජීවිතයේ අදහස් කරන සාමයට වඩා ගැඹුරු අර්ථයක් මෙහි ගැබ්වේ. සහනය, සෞභාග්‍යය, යහපත් සෞඛ්‍යය, පරිපූර්ණත්වය, ආරක්ෂාව වැනි සියලු තත්ත්වයන්ගේ එකතුවක් ලෙස මෙය හඳුන්වා දිය හැකි ය.

**ඉවසීම** යනු විශේෂයෙන්, "දරා ගැනීම" මින් අදහස් වේ. අන් අය සමග සබඳතාවල දී ද විරුද්ධාවාදීකම් මධ්‍යයේ ගමන් කරන විට දී ද වඩාත් ඉස්මතු විය යුතු ගුණාංගයකි.

**කරුණාව** යනු ශුද්ධාත්මයාණන් වහන්සේ තුළ මිත්‍රශීලිත්වය - දයානුකම්පාව - උපකාරවන්තකම යන ගුණාංගයන්ගේ එකතුවක් ලෙස මෙය දක්විය හැකි ය. අන් අය දේව ස්වභාවය අවබෝධ කර ගනු ලබන්නේ කිතුනු අපගේ ජීවිත පැවැත්ම තුළින් ප්‍රකාශවන කරුණාවන්තකමේ ස්වභාවය තුළිනි. අන්‍යොන්‍ය සබඳතාවල දී මෙය වඩාත් වැදගත් වන ගුණාංගයක් වේ. අන්‍යයන් වෙනුවෙන් ක්‍රියා කරන විට ඉතා උනන්දුවෙන් හා අවධානයෙන් ඔවුන්ගේ අවශ්‍යතා තේරුම් ගෙන ක්‍රියා කිරීම මෙයට අදාළ ය.
**යහපත්කම** යනු අන් අය ගැන සැලකිලිමත් වෙමින්, ඔවුන්ගේ අවශ්‍යතා ඉටු කිරීමට

යොමු වීමත්, සාධාරණ ලෙස ක්‍රියා කරමින් නපුර පිටුදැකීමත් යන ශුද්ධාත්මයාණන්ගෙන් ලබන ඵල වේ.

**විශ්වාසවන්තකම** යනු ජීවිතයේ මුහුණ දෙන සියලු ගැටලු හා අර්බුදකාරී තත්ත්වයන් හමුවේ නොසැලී නොපසුබට ව දෙවියන් වහන්සේ තුළ ශක්තිමත් ව ක්‍රියා කිරීමයි.

**මෘදුකම** යනු නිහතමානී ව, යටහත් ව අන් අය කෙරෙහි සංවේදී වීමේ ගුණාංගයකි.

**ආත්ම දමනය** යනු තම හැඟීම් ආශාවන් පාලනය කර ගනිමින් ජීවිතයට විනයක් හා සංයමයක් ලැබීමයි.

## ඒ වටිනා ඵල අප ජීවිත තුළ වර්ධනය කර ගත හැකි අයුරු විමසා බලමු

- ඔබේ විරුද්ධවාදීන් ඔබට පීඩා කරන කල, ඔවුන්ට පෙරළා පීඩා කරනු වෙනුවට ඔවුන් පිළිබඳ ව ඔබට දයාවේ හැඟීමක් හටගන්නේ නම්, පෙරළා යමක් බලාපොරොත්තු නොවී අනුන්ට උපකාර වන්නට හැඟීමක් ඔබ තුළ හටගන්නේ නම් එම ශුද්ධාත්ම ඵලය **ප්‍රේමය** යි.
- අසනීප, පවුල් අර්බුද, පාසලේ ගැටලු හමුවේ දෙවිඳුන්ට ප්‍රශංසා කරමින් ජ්වලිතකමේ ආත්මයෙන් ජීවත් වීමට හැකියාව ඇත්නම් එසේ වර්ධනය වී ඇති ශුද්ධාත්ම ඵලය **ප්‍රීතිය** යි.
- ජීවිතයේ අවිනිශ්චිත තත්ත්වයන් මැද ගමන් කරන විට, බලාපොරොත්තු බිඳ වැටී, තරහ වේදනාව හදවතේ ඇති කර ගනු වෙනුවට සහනය ළඟා කරවන හැඟීමකින් හදවත පුරවන ශුද්ධාත්ම ඵලය **සාමය** යි.
- අන් අයගේ විවේචන එල්ල වන විට ඔවුනට යහපත ම පැතීමටත්, ඔබේ ජීවිතයේ ගැටලු, අභියෝගවල දී නොබිය ව ඒවාට මුහුණ දීමට ඔබ යොමු කරවන ශුද්ධාත්ම ඵලය **ඉවසීම** යි.
- නිරතුරු ව ම ඔබ අවට සිටින අය වෙනුවෙන් ඔවුන්ගේ විපතේ දී, ප්‍රශ්ණයේ දී, ගැටලුවේ දී උපකාර කිරීමට ඔබ මෙහෙයවන ශුද්ධාත්ම ඵලය **කරුණාව** යි.
- තමකම පසෙක ලා ඔබේ පාසලේ, පන්තියේ මිතුරන්ට මිතුරියන්ට උපකාර කිරීමට ඔබට මඟ පෙන්වන ශුද්ධාත්ම ඵලය **යහපත්කම** යි.
- ජීවිතයේ සෑම තත්ත්වයක් තුළ දී ම දෙවියන් වහන්සේ කෙරෙහි ඇදහිල්ලෙන් ශක්තිමත් ව සිටීමට ඔබ පොලඹවන ශුද්ධාත්ම ඵලය **විශ්වාසය** යි.
- නිහතමානී ව, අන් අයගේ දුක් වේදනාවලට සංවේදී වීමට හා යටහත් පහත් ලෙස ජීවත් වී නිරතුරු ව ම ඔවුන් ළඟ සිටිමින් ඔවුන්ට පිහිට වීමට ඔබ යොමු කරවන ශුද්ධාත්ම ඵලය **මෘදුකම** යි.
- පාසලේ දී, පන්තියේ දී, සමාජයේ දී ඔබට ස්වයං පාලනයකින් ජීවිතය හසුරුවා ගෙන දෙවියන් වහන්සේගේ කැමැත්තට ඇලුම් වීමට උපකාර කරන ශුද්ධාත්ම ඵලය **ආත්ම දමනය** යි.

ඔබේ ආධ්‍යාත්මික ජීවිතය සම්පූර්ණ වීමට හා අලංකාර වීමට මෙම ශුද්ධාත්ම ඵල සියල්ල

ඔබේ ජීවිතය තුළ එක්රැස් විය යුතු වේ. ඒ මඟින්,

- ★ මනස්ථාපනය වෙමින්, පාපය කුරුසිපත් කරමින් නව දිවියකට ඇතුළත් වීමට හැකියාව ලැබේ.
- ★ වැරදි චේතනා, හැඟීම්, ක්‍රියා දුරැලූ දිවියක් ගත කිරීමට අවකාශ සැලසේ.
- ★ නිරතුරු ව ම ශුද්ධාත්ම මඟපෙන්වීම ජීවිතයේ අත්දැකීමට අවස්ථාව උදා වේ.
- ★ අන්‍යෝන්‍ය යහපත සලසමින් ගුණගරුක ජීවිත සමාජය තුළ වර්ධනය කිරීමට හැකියාව අත් වේ.
- ★ සදාකල් ක්‍රිස්තුස් වහන්සේට අයත් දරුවන් වීමේ භාග්‍යය හිමි වේ.

**ක්‍රියාකාරකම**

1. ශුද්ධාත්ම ඵල මතකයෙන් ලියා කුඩා කාඩ්පතක් සකසන්න. එය වර්ණවත් ව අලංකාර කරන්න.
2. ශුද්ධාත්ම ඵල ඔබගේ ජීවිතය තුළ වර්ධනය කර ගැනීමෙන් ඔබ තුළ කෙබඳු වෙනසක් ඇතිවේ ද?